ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
உள்நாட்டலுவல்கள்அமைச்சு
MINISTRY OF HOME AFFAIRS

අභ්‍යන්තර විගණන අංශය
உள்ளகக் கணக்காய்வுப் பிரிவு
Internal Audit Division

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திரச்சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.

(7)

මගේ අංකය / எனது இல / My No: HA/IA/03/CIR/01 | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 2018.08.07

**ස්වදේශ කටයුතු චක්‍රලේඛ :- 06/2018**

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

**<u>ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම.</u>**

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පැවැත්වෙන රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීම් වලදී විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම පිළිබඳව නිරන්තරයෙන් අවධානය යොමු කරන බැවින් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලදී පැවැත්වෙන විගණන හා කමනාකරණ කමිටු වලදී එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අදාල කරුණු දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමට කාලය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වී ඇති බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන්ද (අවම වශයෙන් කාර්තුවකට එක් වරක්) විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විමට තීරණය කරන ලදි. මේ තුළින් ප්‍රාදේශීය ලෙකම් කාර්යාල හා සම්බන්ධ කටයුතු පිළිබඳ ඒවායේ මාණ්ඩලික නිලධාරීන් හා අදාල වෙනත් නිලධාරීන් සමග නිරන්තරයෙන් ගැටළු සාකච්ඡා කිරීමට හා තීරණ වලට එළඹීමට අවස්ථාවන් ලැබීම තුළින් අභ්‍යන්තර පාලනය හා කළමනාකරණමය කරුණු වඩාත් ශක්තිමත් මට්ටමකට ගෙන ඒමට අපේක්ෂා කෙරේ.

02 මෙහිදී කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක DMA/2009(1) හා 2009.06.29 දිනැති චක්‍රලේඛය කෙරෙහි සියලුම ප්‍රාදේශීය ලේකම් වරුන්ගේ අවධානය යොමු කරවන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

03. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම පහත පරිදි සිදු කළ යුතු වේ.

**3.1. ප්‍රාදේශීය ලේකම් කාර්යාල විගණන හා කළමනාකරණ කමිටුවේ සංයුතිය .**

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් | - | සභාපති |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක | - | සාමාජික |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී | - | සාමාජික |
| විගණකාධිපති නියෝජිත | - | නිරීක්ෂක |

**3.2. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා සහභාගි කරවා ගත යුතු වෙනත් නිලධාරීන්**

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අදාල මාණ්ඩලික නිලධාරීන් සහ සෙසු නිලධාරීන් සහභාගි කරවා ගත යුතුය. (සාකච්ඡා කරන කරුණු අනුව අවශ්‍ය නිලධාරීන් සහභාගි කරවා ගත යුතුය.)

O/C



දුරකතන / தொலைபேசி / Telephone: 0112581129 | ෆැක්ස් / தொலைநகல் / Fax: 0112504142 | විද්‍යුත් / மின்னஞ்சல் / E-Mail: hainternalaudit381@gmail.com | වෙබ් අඩවිය / இணையதளம் / Web Site: www.moha.gov.lk

3.3. **විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුලත් විය යුතු කරුණු.**

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2009.06.29 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ DMA/2009(1) හි ඇමුණුම 01 මගින් දක්වා ඇති විගණන හා කළමනකාරණ කමිටු සඳහා යෝජිත පොදු කාර්ය නිර්දේශයන්ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාල විශේෂිත කාර්යයන්ද සමාලෝචනය කල යුතුය. විශේෂයෙන් පසුගිය රැස්වීමේදී ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා සම්බන්ධ අභ්‍යන්තර විගණන වාර්තා සහ විගණකාධිපති විගණන විමසුම් වලින් පෙන්වා දෙන විශේෂිත කරුණු සමාලෝචනය කිරීම හා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසු විපරම් කිරීමද සිදු කළ යුතුය.

තවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති පසුගිය විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කළ කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් තම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මූල්‍ය කාර්යක්ෂමතාවය හා අභ්‍යන්තර පාලන ක්‍රම වැඩිදියුණු කිරීමට අවශ්‍ය විධිවිධාන යෙදීම කළ යුතුය. කළමනාකරණ විගණන චක්‍රලේඛ DMA/2009(1) හි ඇමුණුම 01 ඔබගේ දැන ගැනීම සඳහා මේ සමග අමුණා ඇත.

04. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල විගණන හා කළමනාකරණ කමිටු කටයුතු හා අභ්‍යන්තර විගණන කටයුතු සඳහා විෂය දැනුමැති සංවර්ධන නිලධාරියෙකු හෝ වෙනත් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු අනුයුක්ත කිරීම තුළින් විගණන හා කළමනාකරණ කමිටුවේ කටයුතු වඩාත් ස්වාධීනව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙලක් යොදන ලෙස සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් ලබා දෙන ලෙසද වැඩිදුරටත් දන්වා සිටිමි.

05. ඉහත සඳහන් උපදෙස් පිළිබඳව ඔබ දිස්ත්‍රික්කයට අදාල සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර වහාම ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි. තවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවැත්වෙන විගණන හා කළමනාකරණ කමිටුවේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමේ ප්‍රගතිය නිරන්තරයෙන් සාකච්ඡා කිරීමට කටයුතු කරන ලෙසද කාරුණිකව දන්වමි.

එස්.ටී.කොඩිකාර
ලේකම්
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

o/c

පිටපත්:-
01. ලේකම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව - දැ.ගැ.ස
02. විගණකාධිපති - දැ.ගැ.ස
03. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස
04. අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු) - දැ.ගැ.ස
05. ප්‍රධාන මූල්‍ය නිලධාරී, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැ.ගැ.ස
06. ප්‍රධාන අභ්‍යන්තර විගණක, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - අ.ක.ස
07. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල - අ.ක.ස

ඇමුණුම 01

## විගණන හා කළමනාකරණ කමිටු සඳහා යෝජිත

## පොදු කාර්යය නිර්දේශය

(1) අභ්‍යන්තර විගණන ඒකකයේ කාර්ය පථය නිර්නය කිරීම

(2) වාර්ෂික විගණන සැළැස්ම හා වැඩ සටහන පූර්ව විමසුමට භාජනය කර අනුමත කිරීම. අභ්‍යන්තර විගණක විසින් බාහිර විගණක/විගණකාධිපතිගේ උපදෙස් ඇතිව වාර්ෂික විගණන සැළැස්ම පිළියෙල කිරීම

(3) අභ්‍යන්තර විගණන වාර්තා මත පදනම් වූ ගිණුම්කරණය, මූල්‍ය හා මෙහෙයුම් අංශයන් ආවරණය වන අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීම හා ඇගයීම

(4) බාහිර විගණකවරයාගේ වාර්තාව නිතිපතා සමාලෝචනය කිරීම හා ඌණතාවයන් යළි ඇතිවීම වළක්වාලීම පිණිස අවශ්‍ය නිවැරදි පියවර ගැනීම

(5) අයවැය සමාලෝචන වාර්තා ඇතුළු මූලික අභ්‍යන්තර මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම හා පිරිවැය සඵලතාවය, කාර්ය සාධනය හා ඉලක්ක සාක්ෂාත් කර ගැනීම ඇගයීම

(6) ගිණුම්කරණය පිළිබඳ ප්‍රමිතීන් පිළිපැදීම පිළිබඳ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම

(7) අවසන් ගිණුම්, වාර්ෂික වාර්තා යනාදිය කාලීනව ඉදිරිපත් කිරීම සහතික වීම

(8) අභ්‍යන්තර විගණකවරුන් හා බාහිර විගණකවරුන් අන්‍යෝන්‍ය එකඟතාවය ඇතිව කටයුතු කිරීම

(9) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩල ව්‍යවස්ථා හා අනෙකුත් නීති හා රෙගුලාසි පිළිබඳ මනා අවබෝධයක් ලබාගත යුතු බවට සහතික වීම

(10) භාණ්ඩාගාර චක්‍රලේඛයන් හා වෙනත් නියෝග පිළිබඳ දැනුවත් කිරීම හා ඒවා පිළිපැදීමේ අවශ්‍යතාවය පෙන්වා දීම

(11) සියළුම මානව හා වෙනත් සම්පත් පරිපාලනය හා සංවර්ධනය කිරීමේ කටයුතු සමාලෝචනය කිරීම හා තීරණ ගැනීම සඳහා වාර්තා ඉදිරිපත් කිරීම

(12) කාර්ය මණ්ඩල විනයට අදාළ කරුණු සමාලෝචනය කිරීම, නාස්තිය හා දූෂණය පිටු දැකීම හා ආයතනය වියදම් අරපිරිමැස්ම කෙරෙහි යොමු කරවීම

(13) ව්‍යවස්ථාපිත හා වෙනත් නීතිරීතීන් සමාලෝචනය කිරීම

(14) අභ්‍යන්තර විගණකවරයාගේ වාර්තාව ක්‍රමවත්ව සමාලෝචනය කිරීම හා පෙන්වා දී ඇති ඌණතාවයන් සම්බන්ධව කඩිනමින් කටයුතු කිරීම

(15) රාජ්‍ය ව්‍යවසාය කමිටුවේ හා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම, සමාලෝචනය කිරීම

(16) නිර්දේශවල සාරාංශය රාජ්‍ය ව්‍යවසාය මණ්ඩලය/අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා වෙත අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කිරීම

(17) කමිටු නිර්දේශයන් මත පදනම් වූ ක්‍රියාකාරකම්/අනුමත කිරීම අන්වේෂනය කිරීම

(18) කමිටුවේ කාර්ය සාධනය පිළිබඳ වාර්තාව වාර්ෂික වාර්තාවට/පරිපාලන වාර්තාවට ඇතුළත් කිරීම සඳහා ඉදිරිපත් කිරීම

(19) වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම, ක්‍රියාකාර සැළැස්ම සහ සංයුක්ත සැළැස්ම විමර්ශනය කිරීම